# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2300/09 - 2022 ඔක්තෝබර් මස 04 වැනි අඟහරුවාදා - 2022.10.04

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

**ගුරු උපදේශක සේවයේ සේවා ව්‍යවස්ථාව සංශෝධනය කිරීම - සංශෝධන අංක 01**

අංක 2182/36 හා 2020.07.01 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයෙ* හි පළ කරන ලද ගුරු උපදේශක සේවා ව්‍යවස්ථා සංග්‍රහය පහත ආකාරයට සංශෝධනය කරනු ලැබේ. එහි සඳහන් අනෙකුත් කරුණු හා කොන්දේසි නොවෙනස්ව පවතී.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගය පරිදි,

**එම්. ඒ. බී. දයා සෙනරත්,**
ලේකම්,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

2022 සැප්තැම්බර් මස 27 වැනි දින.

14.4 (*අ*) 2022.01.02 දිනට සේවයේ යෙදී සිටින එදිනට පෙර ගුරු උපදේශක සේවය සඳහා අන්තර්ග්‍රහණය වීමට මනාපය පල කරන ලද සියලුම නිලධාරීන් මෙම සේවා ව්‍යවස්ථාවේ 14.1 යටතේ සඳහන් විධිවිධාන අනුව 2022.01.02 දින සිට බලාත්මක වන පරිදි ශ්‍රී ලංකා ගුරු උපදේශක සේවයට අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

(*ආ*) ඉහත (*අ*) උපවගන්තිය යටතේ සඳහන් විධිවිධානයන් අනුව 2022.01.02 දින සිට සේවයට අන්තර්ග්‍රහණය කරනු ලබන නිලධාරීන්ගේ, 2020.07.01 දින සිට සිදුකර ඇති අන්තර්ග්‍රහණය අවලංගු කරනු ලැබේ.

(*ඇ*) කෙලෙස වුව ද 2020.07.01 දින සිට සේවයට අන්තර්ග්‍රහණය කරනු ලැබූ යම් නිලධරයෙකු විසින් ඉදිරිපත් කරනු ලබන ඉල්ලීමක් මත එම නිලධාරියාගේ අන්තර්ග්‍රහණ දිනය තවදුරටත් 2020.07.01 ලෙස සලකා කටයුතු කිරීමට ලේකම්වරයාට හැකිය.

EOG 10-0010

1A - G 37686 — 361 (2022/10) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*